2024.08.

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම 2024
## බුද්ධ ධර්මය
## 8 ශ්‍රේණිය

විභාග අංකය/නම ..............................

කාලය පැය 02 යි

පොදු උපදෙස්

❖ අංක 1 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

### I කොටස

1) බුදුරජාණන් වහන්සේගේ සුහදශීලී කතාබහ තුළ දැකිය හැකි "සම්මෝදකය" යන ගුණයෙන් අදහස් වන්නේ,

(1) විවෘත කතාබහය. (2) සතුටුසාමීචි කතාබහය.
(3) සුව දෙන කතාබහය. (4) තමා පළමුව කතාබහය.

2) බෞද්ධයාගේ අත්පොත ලෙස හැඳින්වෙන ධම්මපදය අයත් වන්නේ,

(1) දීඝ නිකායටයි. (2) සංයුක්ත නිකායටයි.
(3) අංගුත්තර නිකායටයි. (4) ඛුද්දක නිකායටයි.

3) තෙරුවන් ගුණ සංඛ්‍යාව වන්නේ,

(1) 21 කි. (2) 24 කි.
(3) 27 කි. (4) 29 කි.

4) "යේ ධම්මා හේතුප්පභවා" ගාථාව දේශනා කළේ,

(1) ආනන්ද තෙරණුවෝය. (2) බුදුරජාණන් වහන්සේය.
(3) අස්සජි තෙරණුවෝය. (4) නන්ද තෙරණුවෝය.

5) ගිහියාගේ නිත්‍ය ශීලය වන්නේ,

(1) දස ශීලයයි. (2) උපෝසථ අෂ්ටාංග ශීලයයි.
(3) පංච ශීලයයි. (4) ආජීව අෂ්ටමක ශීලයයි.

6) සිගාලෝවාද සූත්‍රයට අනුව හිත - මිතුරු සම්බන්ධය දක්වා ඇත්තේ,

(1) නැගෙනහිර දිශාවෙනි. (2) බටහිර දිශාවෙනි.
(3) උඩ දිශාවෙනි. (4) උතුරු දිශාවෙනි.

7) බෝසතාණන් වහන්සේගේ ප්‍රඥා මහිමය ප්‍රකට වන ජාතක කතාවක් වන්නේ,

(1) සාම ජාතකය ය. (2) සස ජාතකය ය.
(3) උම්මග්ග ජාතකය ය. (4) සීල විමංස ජාතකය ය.

De Mazenod College Kandana

8) එම මොහොතේදී ම ප්‍රතිඵල දැකිය හැකි නිසා ධර්මය,

(1) අකාලිකය. (2) ඕපනයිකය.
(3) සන්දිට්ඨිකය. (4) ඒහිපස්සිකය.

9) බෞද්ධ සදිසා නමස්කාරය ඇතුළත් වන සූත්‍රය වන්නේ,

(1) රතන සූත්‍රයයි. (2) සිගාලෝවාද සූත්‍රයයි.
(3) මංගල සූත්‍රයයි. (4) පරාභව සූත්‍රයයි.

10) "සම්බුද්ධ ශාසනයෙන් අඩක් පමණ සමගියෙන් පවතින්නේ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය නිසා නොවේදැ යි" බුදුරජාණන් වහන්සේගෙන් විමසා සිටියේ,

(1) කාශ්‍යප තෙරණුවෝය. (2) සැරියුත් තෙරණුවෝය.
(3) ආනන්ද තෙරණුවෝය. (4) මුගලන් තෙරණුවෝය.

11) සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි බිරිඳගෙන් ස්වාමි පුරුෂයාට ඉටුවිය යුතු යුතුකමක් වන්නේ,

(1) වගකීම් පවරාදීමය. (2) අවමන් නොකිරීමය.
(3) සම්මාන කිරීමය. (4) ඉපයූ ධනය ආරක්ෂා කිරීමය.

12) භික්ෂූන් වහන්සේලාගේ ආචාර ධර්ම පද්ධතිය හඳුන්වන්නේ,

(1) අධිපති ධර්මය ලෙසය. (2) ලෝක පාලක ධර්ම ලෙසය.
(3) සේඛියා ධර්ම ලෙසය. (4) රාජ ධර්ම ලෙසය.

13) ලෙඩ ඇඳෙහි වේදනාවෙන් සිටිද්දී තමා ඉදිරියේ අනපේක්ෂිත ලෙස දර්ශනය වූ බුදුරුව දැක සිත පහදාගෙන දෙව් ලොව ඉපදුනේ,

(1) ජන්න ය. (2) සුනීත ය.
(3) සෝපාක ය. (4) මට්ටකුණ්ඩලී ය.

14) " මානවකය, සත්ත්වයෝ කර්මයෝ ස්වකීය කොට ඇත්තාහ. කර්මය දායාද කොට ඇත්තාහ." කර්මය කාරණය කොට ඇත්තාහ. කර්මය බන්ධු කොට ඇත්තාහ. කර්මය පිළිසරණ කොට ඇත්තාහ යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාළේ,

(1) මඝ මානවකයාට ය. (2) සුභ මානවකයාට ය.
(3) සිගාලක මානවකයාට ය. (4) ඡත්ත මානවකයාට ය.

15) ජෛන ආගමික නායකයා වන්නේ,

(1) අජිත කේශකම්බලී ය. (2) මක්ඛලී ගෝසාල ය.
(3) සංජය බෙල්ලට්ඨිපුත්ත ය. (4) නිගණ්ඨනාථ පුත්ත ය.

16) උම්මග්ග ජාතකයේ සඳහන් පරිදි මියුලු නුවර පාලකයා වූයේ,

(1) බිම්බිසාර රජු ය. (2) කොසොල් රජු ය.
(3) වෛදේහ රජු ය. (4) දුටුගැමුණු රජු ය.

17) පිරිත් දේශනාවක දී මණ්ඩපයේ පැනවෙන ආසන ගණන වන්නේ,

(1) 12 කි. (2) 10 කි.
(3) 15 කි. (4) 08 කි.

18) අතිරේක චීවර පිළිගැනීමට අවසර ලබා දුන්නේ කාගේ ඉල්ලීමකට ද?

(1) උපාලි ගෘහපතියාගේ
(2) සෝණදණ්ඩ බමුණාගේ
(3) ජීවක වෛද්‍යවරයාගේ
(4) සකුළුදායි පිරිවැජියාගේ

19) මතක වස්ත්‍රය පූජා කිරීම සිදු කරන්නේ,

(1) පිරිත් පිංකමක දී ය.
(2) දානමය පිංකමක දී ය.
(3) අවමංගල්‍ය අවස්ථාවක දී ය.
(4) විවාහ මංගල අවස්ථාවක දී ය.

20) පොහොය දින ගිහියන් සමාදන්වන සීලය වන්නේ

(1) වාරිත්‍ර සිල් ය.
(2) අට සිල් ය.
(3) පන්සිල් ය.
(4) ත්‍රිකෝටික සිල් ය.

(ලකුණු $20 \times 2 = 40$)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර පළමු ප්‍රශ්නය ද ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය ට ලකුණු 20 කි. අනෙක් ප්‍රශ්නවල එක් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 60කි.**

1) දෙවන වාරයට අදාළව ඔබ විසින් පන්ති කාමරයේ කරනු ලැබූ ඇගයීම ඇසුරෙන් i සිට x දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. මෙම ක්‍රියාකාරකම සඳහා යොදාගත් පෙළපොතේ පාඩමේ නම ලියන්න.
ii. සාකච්ඡා මණ්ඩපය සඳහා ඔබට ලබා දුන් ගුරු උපදෙස් 02ක් ලියන්න.
iii. මෙම ක්‍රියාකාරකමේ දී ඔබට ඇති වූ ගැටලු දෙකක් ලියන්න.
iv. එම ගැටලු ජයගත් ආකාරය කෙටියෙන් දක්වන්න.
v. මෙම ක්‍රියාකාරකම තුළින් ඔබ ලබාගත් සමාජ කුසලතා 02ක් දක්වන්න.
vi. නිගණ්ඨනාථපුත්ත ශාස්තෘවරයාගේ ප්‍රධාන දායකයා නම් කරන්න.
vii. තමාට අප්‍රිය දේ අනුන්ට ද අප්‍රිය බැවින් තමා උපමා නොට අන් අයට පීඩා නොකළ යුතු යැයි දේශනා කළ සූත්‍රය නම් කරන්න.
viii. ලාංකිකයන්ට මහ පෙන් වූ අනගිතම දායාදය වූ බුදු දහම මෙරටට හඳුන්වා දුන් මහරහතන් වහන්සේ නම් කරන්න.
ix. දුටුගැමුණු රජු හා සටන් කොට පරාජය වී දුටුගැමුණු රජු විසින් ගෞරව කොට සොහොනක් ද ඉදි කරමින් ගෞරව කළ රජු කවු ද?
x. අන් අය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 02ක් ලියන්න.

(ලකුණු $2 \times 10 = 20$)

2)

i. බුදුරජාණන් වහන්සේ ගැටළු නිරාකරණය කළ අවස්ථා 02ක් නම් කරන්න.
ii. දේවදත්ත කුමරු සමඟ පැවිද්ද ලබාගත් අනෙක් කුමාරවරු තිදෙනා නම් කරන්න.
iii. ගැටලුවක දී ඔබේ යහළුවාට ඔබ ලබා දුන් සාර්ථක විසඳුමක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

3)
i. ධම්ම පදයේ අන්තර්ගත වග්ග සංඛ්‍යාව සහ ගාථා ප්‍රමාණය සංඛ්‍යාව නම් කරන්න.
ii. "යෝ ච පුබ්බේ පමජ්ජිත්වා..................." යන ගාථාව සම්පූර්ණ කරන්න.
iii. මෙම ගාථාවෙන් කියැවෙන අදහස ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

4)
i. මහෞෂධ කුමාරයාගේ දෙමාපියන් නම් කරන්න.
ii. වෛදේහ රජුට අනුශාසනා කළ පඬිවරු තිදෙනෙක් නම් කරන්න.
iii. ප්‍රශ්නයක දී උපාය කුසලතාවයෙන් කටයුතු කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

5)
i. චතුරාර්ය සත්‍ය අතරින් දෙකක් නම් කරන්න.
ii. තණ්හාවේ ප්‍රභේද 03 නම් කරන්න.
iii. තණ්හාවෙන් වෙන්ව කටයුතු කිරීමෙන් ඔබට ලැබෙන යහපත පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

6)
i. බුදුරදුන් සිගාලෝවාද සූත්‍රය දේශනා කළේ කාට ද?
ii. භාර්යාව විසින් තම ස්වාමියා වෙත දැක්විය යුතු යුතුකම් තුනක් ලියන්න.
iii. "කල්‍යාණ මිත්‍ර ආශ්‍රය දියුණුවට මගකි." පැහැදිලි කරන්න.

(ලකුණු 2+3 +5 = 10)

7) පහත සඳහන් මාතෘකා වලින් දෙකකට කෙටි සටහන් ලියන්න.
i. බුද්ධානුස්සති භාවනාව
ii. උපන්දින උත්සවය
iii. දස කුසල්
iv. සැරියුත් තෙරුන් වහන්සේ

(ලකුණු 5x2 = 10)

REGISTRAR
De Mazenod College
Kandana.